**ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුවේ මෙතෙක් ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය**

2026 සැප්තැම්බර් 21 වැනිදා

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් පත් කරන ලද ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුව (CTC), ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පරිවර්තනය කිරීම සඳහා තමන් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේදී මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීම තම වගකීමක් ලෙස සලකයි.

කමිටුව වෙත පැවරී ඇති වගකීම ප්‍රධාන කරුණු තුනක් මත කේන්ද්‍රගත වේ. ඒවා නම්, යහපාලනය ස්ථාපිත කිරීම, ක්‍රීඩා පිටියේ විශිෂ්ඨත්වය ඉහළ නැංවීම සහ තේරී පත් වූ පරිපාලනයක් ස්ථාපිත වන තෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ දෛනික මෙහෙයුම් කටයුතු වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යෑමයි.

ඒ අනුව, මෙම වගකීම් යටතේ මේ දක්වා සිදුකර ඇති කටයුතු සහ අත්කරගෙන ඇති ප්‍රගතිය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට පරිවර්තන කමිටුව අපේක්ෂා කරයි.

**යහපාලනය**

යහපාලනය ස්ථාපිත කිරීමේ අරමුණින්, පරිවර්තන කමිටුව පත්වී මාස දෙකක් වැනි කාලයක් තුළ නව ශ්‍රී ලංකා ක්‍රිකට් ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර එය රජයට භාර දී තිබේ. එම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග මේ වන විට රජය විසින් ගනිමින් සිටී.

ක්‍රිකට් ක්‍රීඩාවේ නවීන අවශ්‍යතා සහ වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් කර ඇති මෙම යෝජිත ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගත සංවර්ධනය සඳහා ස්ථාවර සහ ශක්තිමත් පදනමක් සපයනු ඇතැයි කමිටුව විශ්වාස කරයි.

මෙම යෝජිත ව්‍යවස්ථාව, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය, ශ්‍රී ලාංකික ජනතාව, ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන් ඇතුළු ශ්‍රී ලංකා ක්‍රිකට් හි සියලු ප්‍රධාන පාර්ශ්වකරුවන්ට පිළිගත හැකි වනු ඇති බව අපගේ විශ්වාසයයි.

**දේශීය ක්‍රීඩා සමාජ**

වත්මන් අන්තර් සමාජ ප්‍රධානතම ටියර් ‘A’ කාණ්ඩයේ ක්‍රීඩා සමාජ 14, ඉදිරි වසර දෙක තුළ 10 දක්වා අඩු කිරීමටත්, ටියර් ‘B’ කාණ්ඩයේ ක්‍රීඩා සමාජ 12, එලෙසම පවත්වාගෙන යාමටත් ක්‍රිකට් පරිවර්තන කමිටුව තීරණය කර තිබේ.

ටියර් ‘A’ කාණ්ඩයේ ක්‍රීඩා සමාජ සංඛ්‍යාව අඩු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ රටේ සිටින දක්ෂතම ක්‍රීඩකයන් ඉහළම මට්ටමේ දේශීය තරගාවලියට එක් කිරීම සහ එමඟින් වඩාත් තරගකාරී ක්‍රිකට් වටපිටාවක් නිර්මාණය කිරීමයි.

වඩාත් තරගකාරී ක්‍රිකට් ව්‍යුහයක් හරහා දේශීය ක්‍රිකට් ක්‍රීඩාවේ සමස්ත ප්‍රමිතිය ඉහළ නැංවීමටත්, ජාතික කණ්ඩායම් සඳහා දක්ෂ ක්‍රීඩකයන් සපයන මාර්ගය තවදුරටත් ශක්තිමත් කිරීමටත් හැකි වනු ඇතැයි කමිටුව විශ්වාස කරයි.

**තරගාවලි කාලසටහන්**

ටියර් 'A' කාණ්ඩයේ ලීග් තරගාවලිය දැනට ක්‍රියාත්මක වන දින තුනක ආකෘතිය වෙනුවට දින හතරක් පුරා පැවැත්වීමටද ක්‍රිකට් පරිවර්තන කමිටුව තීරණය කර තිබේ.

ක්‍රිකට් ක්‍රීඩාවේ උත්තරීතම ආකෘතිය ලෙස සැලකෙන ටෙස්ට් ක්‍රිකට් සඳහා ක්‍රීඩකයන් වඩාත් හොඳින් සූදානම් කිරීමට දින හතරක දේශීය තරගාවලියක් වැදගත් පියවරක් වනු ඇතැයි කමිටුව විශ්වාස කරයි.

එමෙන්ම, ක්‍රීඩකයන්ට ප්‍රමාණවත් විවේක කාලයක් ලබාදෙමින් පැහැදිලි සහ විධිමත් දේශීය ක්‍රිකට් දින දර්ශනයක් සකස් කිරීම සඳහාද පියවර ගෙන තිබේ.

මෙමඟින් ක්‍රීඩකයන්ට සිදුවිය හැකි ආබාධ සහ අධික වෙහෙස හේතුවෙන් ක්‍රීඩකයන්ගේ අවදානම අවම කිරීමට හැකි වන අතර, ක්‍රීඩා සමාජ, පුහුණුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වවලට තම කටයුතු කල්තියා සැලසුම් කිරීමට ප්‍රමාණවත් කාලයක් හිමි වනු ඇත.

අනාගත ජාතික කණ්ඩායම් නියෝජනය සඳහා දක්ෂතා හඳුනාගෙන සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ක්‍රිකට් ජාතික පෝෂක මාර්ගයේ වැදගත් අංගයක් වන ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් තරගාවලිය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතුද මේ වන විට සිදු වෙමින් පවතී.

**තණතීරු ප්‍රමිතිය ඉහළ නැංවීම**

රට පුරා ක්‍රිකට් තණතීරුවල ප්‍රමිතිය ඉහළ නැංවීමේ වැඩපිළිවෙළේ කොටසක් ලෙස, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ හිටපු ප්‍රධාන තණතීරු භාරකරු ඇන්ඩි ඇට්කින්සන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති ස්වාධීන සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියකින් අනතුරුව පළපුරුදු ප්‍රධාන ජාතික තණතීරු සකසන්නකු බඳවා ගැනීමට පරිවර්තන කමිටුව කටයුතු කර තිබේ.

මීට අමතරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණවල සේවය කරන සියලුම තණතීරු සකසන්නන් මේ වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සෘජු සේවයට බඳවාගෙන තිබේ.

මෙමඟින් තණතීරු සකස් කිරීමේ අංශය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට වඩාත් සෘජු කළමනාකරණ බලයක් හිමිවන අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර ප්‍රමිතීන් කරා සංවර්ධනය කිරීමේ පුළුල් දැක්මට අනුකූලව තණතීරු සකස් කිරීමටද හැකි වනු ඇත.

**පුහුණුකරණයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම**

දිස්ත්‍රික් සහ පළාත් පුහුණුකරණ ව්‍යුහයන්හි ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා ක්‍රිකට් පරිවර්තන කමිටුව මේ වන විට වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරමින් සිටී.

විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියකින් අනතුරුව නව දිස්ත්‍රික් සහ පළාත් පුහුණුකරුවන් කණ්ඩායමක් පත් කර තිබේ. ගෝලීය වශයෙන් පිළිගත් පුහුණුකරු සංවර්ධන විශේෂඥයකු වන ඈෂ්ලි රොස් මහතාගේ සහභාගීත්වයෙන් මෙම සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉහළ දක්ෂතා මධ්‍යස්ථානයේ ව්‍යුහය මෙන්ම සමස්ත පුහුණුකරණ පද්ධතියද, එහි පවතින පුහුණුකරණ කුසලතා ඇතුළුව, සමාලෝචනය කිරීමට රොස් මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සහාය වෙමින් සිටී. අවශ්‍ය අවස්ථාවලදී කළ යුතු වෙනස්කම් සිදුකිරීම මෙහි අරමුණකි.

දිස්ත්‍රික් සහ පළාත් පුහුණුකරුවන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සෘජු සේවයට බඳවා ගැනීමටද ශ්‍රී ලංකා ක්‍රිකට් පරිවර්තන කමිටුව පියවර ගෙන තිබේ. එමඟින් පුහුණුකරණ ක්‍රියාවලීන් සහ ඒවායේ ප්‍රතිඵල සම්බන්ධයෙන් වඩාත් සෘජු අධීක්ෂණයක් සහ වගවීමක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හැකි වනු ඇත.

**විනිසුරු සහ තරග තීරක ප්‍රමිතීන් ඉහළ නැංවීම**

පාසල් ක්‍රිකට් ක්‍රීඩාවේ සිට ජාතික මට්ටම දක්වා සියලුම මට්ටම්වල විනිසුරු සහ තරග තීරක ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහාද නව පියවර හඳුන්වා දී තිබේ.

සෑම මට්ටමකදීම ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රමිතීන් ඉහළ නැංවීමේ කමිටුවේ පුළුල් අරමුණ සමඟ මෙම වැඩපිළිවෙළද සමානුපාත වේ.

මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, හිටපු ICC විනිසුරුවරයකු වන ලින්ඩන් හැනිබල් මහතා විනිසුරු සංවර්ධන කළමනාකරු ලෙසත්, හිටපු ICC විනිසුරුවරයකු වන රුචිර පල්ලියගුරුගේ මහතා විනිසුරු පුහුණුකරු ලෙසත් බඳවාගෙන තිබේ.

පාසල් ක්‍රිකට්, ක්‍රීඩා සමාජ ක්‍රිකට් සහ ජාත්‍යන්තර ක්‍රිකට් යන ක්‍රිකට් ක්‍රීඩාවේ පෝෂක මාර්ගයේ ආරම්භයේ සිටම, විනිසුරුවරුන් සහ තරග තීරකවරුන් ඇතුළු තරග නිලධාරීන්ගේ ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ ඉහළ නැංවීම සඳහා ඔවුන් කටයුතු කරනු ඇත.

**ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩක සුබසාධන ප්‍රමිතීන් ඉහළ නැංවීම**

ක්‍රීඩක සත්කාර සහ ක්‍රීඩා වෛද්‍ය සේවා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංවර්ධනය කිරීම මෙම වැඩපිළිවෙළේ ප්‍රධාන අරමුණ වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ 1996 ලෝක කුසලානය දිනූ කණ්ඩායමේ භෞතචිකිත්සකවරයකු ලෙස කටයුතු කළ සහ පසුව ක්‍රිකට් ඔස්ට්‍රේලියා ආයතනයේ ප්‍රධාන භෞතචිකිත්සකවරයා ලෙස සේවය කළ ඇලෙක්ස් කොන්ටූරි මහතාගේ සහාය ඇතිව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ක්‍රීඩා වෛද්‍ය අංශය මේ වන විට ප්‍රතිසංවිධානය කරමින් පවතී.

මීට අමතරව, ජාතික පිරිමි කණ්ඩායමේ මානසික කුසලතා සහ මනෝවිද්‍යාත්මක සූදානම ශක්තිමත් කිරීම සඳහා ක්‍රීඩා මනෝවෛද්‍යවරයකුද මෙම වැඩසටහනට එක් කර තිබේ.

**කාන්තා ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීම**

කාන්තා ක්‍රිකට් ක්‍රීඩාව තවදුරටත් සංවර්ධනය කිරීම සහ එහි ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහාද ක්‍රිකට් පරිවර්තන කමිටුව පියවර ගෙන තිබේ.

කාන්තා ක්‍රිකට් ක්‍රීඩිකාවන්ගේ වෘත්තීය සංවර්ධනයට සහාය වීම සහ සමස්ත කාන්තා ක්‍රිකට් වැඩසටහන ශක්තිමත් කිරීමේ පුළුල් වැඩපිළිවෙළක කොටසක් ලෙස, මාධ්‍ය සහ සන්නිවේදන කුසලතා සංවර්ධනය ඇතුළු පුහුණු වැඩසටහන් ආරම්භ කර තිබේ.

**මෙහෙයුම් විධිමත් කිරීම සහ මූල්‍ය කළමනාකරණය**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මෙහෙයුම් කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සහ මූල්‍ය සම්පත් නිසියාකාරව විධිමත් ලෙස කළමනාකරණය කිරීම සඳහා පියවර රැසක් ගෙන තිබේ. එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වාදී ඇත.

ඒවා අතර එම ක්‍රියාමාර්ගයන් නම්, අත්‍යවශ්‍ය නොවන නීතිමය කටයුතුවලින් ඉවත් වීම, අත්‍යවශ්‍ය නොවන උපදේශකවරුන්ගේ සේවය අවසන් කිරීම, පැහැදිළිව නිර්වචනය කළ වගකීම් නොමැතිව පවත්වාගෙන ගිය තනතුරු ඉවත් කරමින් සේවක ව්‍යුහය විධිමත් කිරීම සහ අධික ලෙස විශාල වී තිබූ පුහුණුකරණ ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළත් වේ.

මෙම පියවර මඟින් මූල්‍ය භාවිතය විධිමත් කිරීමටත්, ක්‍රීඩක සංවර්ධනය සහ ක්‍රිකට් යටිතල පහසුකම් සඳහා වැඩි මූල්‍ය ප්‍රතිපාදන යොමු කිරීමටත් හැකි වනු ඇතැයි කමිටුව විශ්වාස කරයි.

**සහන සැලසීම**

පෙර පරිපාලන සමයන්හිදී අසාධාරණ ලෙස දඬුවම් හෝ අවාසිවලට ලක් වූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවකයන්ට සහ ක්‍රීඩා සමාජවලට සහන සැලසීම සඳහාද කමිටුව පියවර ගෙන තිබේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, එහි සේවකයන්, සාමාජික ක්‍රීඩා සමාජ සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් අතර අන්‍යෝන්‍ය අවබෝධය ශක්තිමත් කිරීම සහ විශ්වාසය යළි ගොඩනැගීම මෙම වැඩපිළිවෙළේ අරමුණයි.

**සමාප්ති සටහන**

මෙතෙක් ක්‍රියාත්මක කර ඇති පියවර ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව පරිවර්තනය කිරීමේ මෙන්ම සෑම මට්ටමකදීම ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහයන් යළි ගොඩනැගීමේ වැදගත් පියවරයන් බව ක්‍රිකට් පරිවර්තන කමිටුව විශ්වාස කරයි.

ශ්‍රී ලංකා ක්‍රිකට් යළිත් ලෝක මට්ටමේ සන්නාමයක් බවට පත් කිරීම, සහ එහි ස්ථානය ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය ශක්තිමත් පදනම සකස් කිරීම කමිටුවේ අරමුණයි.

පරිවර්තන ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරන විට එහි අපේක්ෂිත ඉලක්කය වෙත ගමන් කිරීම සඳහා තවදුරටත් ගනු ලබන ක්‍රියාමාර්ග හඳුන්වා දෙනු ඇත.

මේ අතර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විනිවිදභාවය පවත්වාගෙන යෑමටත්, සිදුවෙමින් පවතින වර්ධනයන් පිළිබඳව මහජනතාව අඛණ්ඩව දැනුවත් කිරීමටත් කැපවී සිටියි.